# ස්වයං අධ්‍යයනයට අත්වැලක්

1 ශ්‍රේණිය : 10

2 වාරය : 2

3 නිපුණතා මට්ටම : 6 : 2 ශ්‍රී ලාංකේය මුද්‍රා නාට්‍යය නරඹා විචාරයට ලක්කරයි.

4 ක්‍රියාකාරකම : කලා කෘතියක රස මිහිර පවසමු.

(කුඹී කථාව)







සැකසුම : එච්. අනූෂා සාගරිකා හේරත්
මප/වත්/එස්.ඩබ්.ආර්.ඩී. බණ්ඩාරනායක ජාතික පාසල
කුණ්ඩසාලේ

මෙහෙයවීම : නර්තන අංශය
කලාප අධ්‍යාපන කාර්යාලය
වත්තේගම

**උපදෙස් :**

මෙය ලිඛිත පාඩමකි. මෙම පාඩම වැඩි දුරටත් අධ්‍යනය කිරීම සඳහා පාසලේ ගුරු ඇසුර ලබා ගත යුතුය.

**හැඳින්වීම :**

9 ශ්‍රේණියේදී අප දේශීය නාට්‍ය වර්ග පාඩමේදී මුද්‍රා නාට්‍ය පිළිබඳ අධ්‍යයනය කර ඇත. එහිදී මුද්‍රා නාට්‍යයක තිබිය යුතු ලක්ෂණ සහ මුද්‍රා නාට්‍ය වර්ග පිළිබඳ ඉගෙන ගතිමු.

මෙම පාඩමෙන් අප සුදානම් වනුයේ මුද්‍රා නාට්‍ය අතුරින් එකක් වන කුඹී කතාව මුද්‍රා නාට්‍යයට පසුබිම් වූ කතා පුවත, තේමාව විකාශනය සඳහා නර්තනය යොදාගෙන ඇති ආකාරය, කලාත්මක ලක්ෂණ තීව්‍ර කිරීම සඳහා සංගීතය, රංගවස්ත්‍රාභරණ, වේදිකා සැරසිලි, ආලෝකකරණය යොදා ගෙන ඇති ආකාරය මෙන්ම සමාජයට ලැබෙන ආදර්ශ පිළිබඳ අධ්‍යනය කිරීමට අපි බලාපොරොත්තු වෙමු.

## ➢ කුඹී කතාව මුද්‍රා නාට්‍ය

දේශීය නාට්‍ය ශෛලීන් පිළිබඳව විමසීමේදී මුද්‍රා නාට්‍ය කලාවට හිමිවන්නේ සුවිශේෂී ස්ථානයකි. 2007 දී චිත්‍රසේන කලායතනය මගින් කුඹී කතාව මුද්‍රා නාට්‍ය ඉතාමත් විචිත්‍ර රංගවස්ත්‍රාභරණ යොදාගනිමින් නිර්මාණය වූ සුවිශේෂී නාට්‍යයක් ලෙස හැඳින්විය හැකිය.

ළමා මුද්‍රා නාට්‍යයක් ලෙස හැඳින්විය හැකි මෙය සත්ව චරිත තේමා කොට ගෙන එකී සතුන්ගේ හැසිරීම් රටාවන් පාදක කර ගනිමින් කුඩා දරුවන්ගේ මනසට ගැලපෙන ආකාරයෙන් සහ සමාජයට ආදර්ශයක් ලබා දෙන අයුරින් නිර්මාණය වූවකි.

ටානියා බැරකෝමාගේ පිටපතකට අනුව රංග රචන කාර්යයෙහි නියුතු වනුයේ අංජලිකා මෙල්වානි චිත්‍රසේන මහත්මියයි. රොබට් ජූලින්හි ඇතුළු පිරිස සංගීතයෙන් දායක වූ අතර කලා කටයුතු හා රංග වස්ත්‍ර නිර්මාණයෙහි ලා දායක වනුයේ මහේශ් උමගලීය මහතායි.



# ➤කතා පුවත

කූඹිහු තම රාජධානියේ එදිනෙදා කටයුතුවල නිරත වෙති. විවිධ කුහුඹු පවුල් එහි වාසය කරමින් කුහුඹු රැජිනගේ අණට අනුව කටයුතු කරති. රෙදි විවීම, රෙදි සේදීම, කෑම පිසීම, පිරිසිදු කිරීම මොවුන්ගේ කාර්යයන්ය.

දිනක් කුහුඹු පවුල තම රාජ්‍යයෙන් ඈතට කෑම සෙවීම සඳහා පිටත් වේ. මේ අතරතුර මදුරුවෙක් පැමිණේ. කුහුඹුවන්ගේ නිවාස කඩා බිඳ දමයි. කුහුඹුවන් නැවත එනවිට දකින්නට ලැබුනේ ඒවා විනාශ වී ඇති බවයි. ඔවූහු නැවත රාජ්‍ය ගොඩනැගූහ. ඉන් පසුව තම අසල්වැසි යහලුවන්ට තේ පැන් සංග්‍රහයක් සූදානම් කළහ. එම සාදයට තණකොළ පෙත්තෝ කුරුමිණියෝ හා සමණලයෝ පියඹාගෙන පැමිණෙති.

සාදය ජයට පවතින විට හුළඟ සමඟ වැස්සක් විත් මුළු ප්‍රදේශයම ජලයෙන් යටවෙයි. පියාපත් ඇති අය ඉගිලී ගෙන යති. කුහුඹුවෝ හා අනෙකුත් අය ටින් එක උඩට නැගී බලා හිදිති. පණ බේරා ගැනීමට දඟලන මදුරුවාද කූඹීන් විසින් බේරා ගනු ලැබේ.

# ❖කුඹි කතාවේ විශේෂ අවස්ථා






- කෑම පිසීම, රෙදි සේදීම, ගේ දොර පිරිසිදු කිරීම, පේෂ කර්මාන්ත ආදියෙහි කුඹි පවුල් නිරතව සිටීම.




- නපුරු මදුරුවා පැමිණ කුඹීන් බිය ගන්වා පලවාහැර ඔවුන්ගේ නිවස විනාශ නිරීම.




- තේ පැන් සංග්‍රහයට ආරාධනා කිරීම.







- උත්කර්ෂවත් තේ පැන් සංග්‍රහයක් පැවැත්වීම.

## ❖ කුම්භී කතාවෙන් සමාජයට ලබාදෙන ආදර්ශය

- කුහුඹුවන් අතර ඇති දැඩි සමගිය.
- පරාජය හමුවේ නොසැලී කටයුතු කිරීම.
- හදිසි අවස්ථා වලදී නිවැරදි තීරණ ගැනීම.
- උත්සහයෙන් යලි නැගී සිටීම.
- සතුරාට වුවද විපතේදී පිහිට වීම.



# ❖ නර්තනය

- මුද්‍රා නාට්‍ය පුරා දිවෙන චලන රටා අංජලිකා චිත්‍රසේන මහත්මියගේ නිර්මාණ කෞශල්‍යය ප්‍රකට කරන්නකී.
- ඉතා කුඩා සත්ව චරිත වන කුහුඹුවා, මදුරුවා, පළගැටියා, කුරුමිණියා, සමනලයා වැනි චරිත වලට නර්තන චලන එකතු කිරීම තුලින් වේදිකාව තුල සජීවී බවක් නිර්මාණය කොට ඇත.

උදා :

කුහුඹුවන් කෑම සෙවීමට යෑම, ආහාර පිළියෙල කිරීම, ගේ දොර පිරිසිදු කිරීම, පේෂ කර්මාන්ත ආදියෙහි නිරත වීම වැනි දෑ නිරූපණය කරීමේදී නිර්මාණාත්මක ලෙස චලන හසුරුවා තිබිම තවද තේ පෝච්චිය සහ කෝප්ප සජීවී චරිත බවට වේදිකාව තුල පත්කර තිබිම ගත හැක.

තවද තේ පැන් සාදයට පැමිණෙන පළගැටියා, කුරුමිණියා, සමනලයා, කණාමැදිරියා වැනි සතුන්ට ආවේණික වූ චලන ඉතාමත් ආකර්ෂණීය ලෙස යෙදා තිබීම.






## ❖ සංගීතය

- මෙහි සංගීතය ගත් කල බටහිර ආරයට නැඹුරු වූ බවක් පෙනේ. මේ සඳහා බටහිර වාද්‍ය භාණ්ඩ මෙන්ම ආදේශ භාණ්ඩද රොබට් ජූලින්හි ඇතුළු පිරිස යොදාගෙන ඇත.
- චරිත වලින් නිරූපණය වන භාවයන් වඩාත් තීව්‍ර කිරීම සඳහා සංගීතය මැනවින් යොදා ගෙන තිබිම.

උදා :

මදුරුවාගේ හඬ වැනි සියුම් අවස්ථා සංගීතයේ නිරූපණය කිරීම. විටෙක ශෝකී අවස්ථාවන් මෙන්ම තවත් විටෙක ඉතාමත් ප්‍රීති ජනක අවස්ථාවන් නිරූපණයේදී සංගීතය ක්‍රියාකාරී ලෙස යොදා තිබිම.

උදා :

මදුරුවා කුහුඹු රාජධානිය විනාශ කර තිබූ අවස්ථාව, තේ පැන් සාදය පවත්වන අවස්ථාව සහ එම අවස්ථාවේදී කුරුමිණියන් තම්මැට්ටම් වාදන පැවැත්වීම ගත හැක.



## ❖ රංගවස්ත්‍රාභරණ

- මෙහි එන රංගවස්ත්‍රාභරණ වල විශේෂත්වය වන්නේ විවිධ වර්ණ රටාවක් වෙත නැඹුරු වීමය.
- කුහුඹුවා, මදුරුවා, පළගැටියා, කුරුමිණියා, සමනලයා වැනි කුඩා සත්ව චරිත වේදිකාව තුල සජීවී චරිත බවට පත් කිරීමට නර්තන චලන මෙන්ම රංග වස්ත්‍රාභරණද මහඟු ලෙස ඉවහල් වී ඇත.

උදා :

කුහුඹුවාගේ පසු පෙදෙස උස්ව සිටින ආකාරයට රංග වස්ත්‍ර නර්මාණය කිරීම.



## ❖ වේදිකා සැරසිලි

- වේදිකා සැරසිලි ලෙස මෙහි කුහුඹුවන්ගේ රාජධානිය, ගංවතුර පැමිණෙන අවස්ථාව, වේදිකාවේ පසෙකට වන්නට තබා ඇති ටින් එක පෙන්වා දිය හැක.



- කෑම පිසීමේ උපකරණ පේෂ කර්මාන්තයට අදාල උපකරණ, ආරාධනා පත්‍රය, තේ පෝච්චිය, තේ කෝප්ප ආදිය මෙහිදී වේදිකාව තුල රංග භාණ්ඩ ලෙස යොදාගෙන ඇත.

## ❖ ආලෝකකරණය

- චරිත වල භාවයන් ඔප් නැංවීම සඳහා ආලෝකකරණය විශිෂ්ඨ මෙහෙවරක් ඉටු කරයි.
- කුහුඹුවන් වේදිකාවට පැමිණෙන අවස්ථාව මද අඳුරු ස්වභාවයක් ගැනීම, ඔවුන් එදිනෙදා කාර්යයන් වල නියැලීමේදී දීප්තිමත් ආලෝකයක් යොදා ගැනීම. සහ මදුරුවා කුහුඹු රාජධානිය විනාශ කිරීමට පැමිණෙන අවස්ථාවේ මදුරුවාගේ භාවයන් ඉස්මතු වන පරිදි ආලෝකය තුලින් විශේෂ කර දැක්විම, තවද ගංවතුර ගලන අවස්ථාවේදී ආලෝකය නිල් පැහැ වීම යනාදිය උදාහරණ ලෙස පෙන්වා දිය හැක.

